# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන මහාජන ආරක්ෂක (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1978 පෙබරවාරි මස 7 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1978 පෙබරවාරි මස 10 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිල : ශත 30 යි. තැපැල් ගාස්තුව : ශත 15 යි.

# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන මහජන ආරක්ෂක (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1978 පෙබරවාරි මස 7 වන දින]

එල්. ඩී.—ඕ. 7/78

**මහජන ආරක්ෂක ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන මහජන ආරක්ෂක (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. (ලුහුඬු නාමය.)

**2.** මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— (40 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.)

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) මේ ආඥාපනතේ II වන කොටසේ විධිවිධාන (1) වන උපවගන්තිය යටතේ යම් ප්‍රකාශනයක් ප්‍රකාර යම් දිනයක ක්‍රියාත්මක වී තිබෙන අවස්ථාවක, ඒ විධිවිධාන, මේ වගන්තියේ අනුප්‍රාප්තික විධිවිධානවලට යටත්ව, එම දින සිට එක් මාසයක කාලයක් සඳහා ක්‍රියාත්මක විය යුතු නමුත් ඒ ප්‍රකාශනය කලින් ප්‍රත්‍යාදිෂ්ට කිරීමට හෝ ඒ කාලය අවසානයේ දී හෝ අවසානවීමට පෙර මැසිදුර ප්‍රකාශනයක් කිරීමට හානියක් නොමැතිව එසේ ක්‍රියාත්මක විය යුතු ය."; තව ද

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන් :—

"(4) මේ ආඥාපනතේ II වන කොටසේ විධිවිධාන (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් ප්‍රකාශනයක් ප්‍රකාර යම් දිනයක ක්‍රියාත්මක වූ අවස්ථාවක, ඒ ප්‍රකාශනය ජාතික රාජ්‍ය සභාවේ යෝජනා සම්මතයකින් අනුමත කරනු ලැබ තිබේ නම් මිස, ඒ කොටසේ විධිවිධාන ක්‍රියාත්මක වූ දින සිට දින දහනරක කාලයකට පසු ඒ ප්‍රකාශනය බලරහිත විය යුතු ය :

එසේ වුව ද—

(අ) ඒ කොටසේ විධිවිධාන ක්‍රියාත්මක වන වේලාවේ දී ජාතික රාජ්‍ය සභාව විසුරුවා හරිනු ලැබ තිබේ නම්, හෝ

(ආ) (3) වන උපවගන්තියේ සඳහන් වන පරිදි යම් අඩාළව කල් තැබීමක් හෝ වාර අවසාන කිරීමක් නිසා ඒ වේලාවේ දී ජාතික රාජ්‍ය සභාව විසංයුක්තව තිබේ නම්, හෝ

(ඇ) මේ වගන්තියේ (3) වන උපවගන්තියෙන් හෝ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40 වන වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි රැස්වන ලෙස කැඳවන ලද විට ජාතික රාජ්‍ය සභාව රැස් නොවන්නේ නම්

ජාතික රාජ්‍ය සභාව ඊළඟට රැස් වී කටයුතු කරන දිනයේ එම රැස්වීමේ දී ඒ ප්‍රකාශනය ජාතික රාජ්‍ය සභාවේ යෝජනා සම්මතයකින් අනුමත කරනු ලැබුවහොත් මිස ඒ ප්‍රකාශනය එම දිනයේ සිට දින දහයක කාලයකට පසු බලරහිත විය යුතු ය.

(5) මේ ආඥාපනතේ II වන කොටසේ විධිවිධාන ක්‍රියාත්මක වූ දින සිට දින දහතරක කාලයක් ඇතුළත යම් වේලාවක (1) වන උපවගන්තිය යටතේ ප්‍රකාශනයක් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ විටක හෝ (4) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව එවැනි ප්‍රකාශනයක් බලරහිත වූ විටක, එම ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ හෝ බලරහිත වීමේ දින සිට දින දහතරක කාලයක් අවසාන වීමට පෙර (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් වැඩිදුර ප්‍රකාශනයක්, එම ප්‍රකාශනය කිරීම ජාතික රාජ්‍ය සභාවේ ඊළඟ රැස්වීමේ දී යෝජනා සම්මතයකින් අනුමත කරනු ලැබුවහොත් මිස, ක්‍රියාත්මක නොවිය යුතු ය.

(6) මේ ආඥාපනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් මුව ද, අනුක්‍රමික ලින් මාස හයක් ඇතුළත, අනුක්‍රමික දින අනූවක කාලයක් තුළ හෝ සමස්තයක් වශයෙන් ගත් විට දින අනූවක කාලයක් තුළ මේ ආඥාපනතේ II වන කොටසේ විධිවිධාන ක්‍රියාත්මක වී තිබුණු අවස්ථාවක, මේ ආඥාපනතේ II වන කොටසේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා (1) වන උපවගන්තිය යටතේ කරන ලද කිසිම ප්‍රකාශනයක්, එය අනුප්‍රාප්තික ලින් මාස හය ඇතුළත යම් වේලාවක කරනු ලැබුවේ නම්, යෝජනා සම්මතයට පක්ෂව ඡන්දය දෙන්නා වූ ජාතික රාජ්‍ය සභාවේ (පැමිණ නොසිටි මන්ත්‍රීවරයන් ද ඇතුළුව) සම්පූර්ණ මන්ත්‍රීවරයන්ගේ සංඛ්‍යාවෙන් යටත් පිරිසෙයින් තුනෙන් දෙකක සංඛ්‍යාවක් විසින් සම්මත කරන ලද ජාතික රාජ්‍ය සභාවේ යෝජනා සම්මතයකින් එම ප්‍රකාශනය අනුමත කරනු ලැබිණි නම් මිස, ඒ ප්‍රකාශනයෙන් ඒ කොටසේ විධිවිධාන ක්‍රියාත්මක කරනු ලැබුවේ යම් දිනයක සිට ද එම දින සිට දින දහයකට වැඩි කාලයක් සඳහා ක්‍රියාත්මක නොවිය යුතු ය:

එසේ වුව ද—

(අ) ඒ ප්‍රකාශනය කරනු ලබන දිනයේ දී ජාතික රාජ්‍ය සභාව විසුරුවා හරිනු ලැබ තිබේ නම්, හෝ

(ආ) (3) වන උපවගන්තියේ සඳහන් පරිදි යම් අඛාලව කල් තැබීමක් හෝ වාර අවසාන කිරීමක් නිසා එම වේලාවේ දී ජාතික රාජ්‍ය සභාව විසංයුක්තව තිබේ නම්, හෝ

(ඇ) මේ වගන්තියේ (3) වන උපවගන්තියෙන් හෝ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40 වන වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි රැස්වන ලෙස කැඳවන ලද විට ජාතික රාජ්‍ය සභාව රැස් නොවන්නේ නම්

යෝජනා සම්මතයට පක්ෂව ඡන්දය දෙන්නා වූ ජාතික රාජ්‍ය සභාවේ (පැමිණ නොසිටි මන්ත්‍රීවරයන් ද ඇතුළුව) සම්පූර්ණ මන්ත්‍රීවරයන්ගේ සංඛ්‍යාවෙන් යටත් පිරිසෙයින් තුනෙන් දෙකක් විසින් සම්මත කරන ලද යෝජනා සම්මතයකින් ජාතික රාජ්‍ය සභාව විසින් ඒ ප්‍රකාශනය අනුමත කරනු ලැබුවහොත් මිස, ඒ ප්‍රකාශනය ජාතික රාජ්‍ය සභාව ඊළඟට රැස්ව කටයුතු කරන දිනයට පසු දින දහයක කාලයක් අවසානයේ දී බලරහිත විය යුතු ය.

(7) ජාතික රාජ්‍ය සභාව විසින් ප්‍රකාශනයක් අනුමත කරනු ලැබීම පිළිබඳ දැන්වීම, හැකි පහසු ඉක්මනින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

'(1) මහාජන ආරක්ෂාව සඳහා ද මහාජන සාමය රැක ගැනීම සඳහා ද කැරලි ගැසීම්, කෝලාහල හෝ මහාජන කැළඹීම් මැඩපැවැත්වීම සඳහා ද නැතහොත් ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය වූ සේවාවන් හා සැපයීම් පවත්වා ගෙන යාම සඳහා ද අවශ්‍ය යයි හෝ අවස්ථාවෝචිත යයි තමාට පෙනී යන (මෙහි මින් මතු "හදිසි අවස්ථා නියෝග" යනුවෙන් සඳහන් කරනු ලබන) නියෝග ජනාධිපතිවරයා විසින් සාදනු ලැබිය හැකි ය.'; සහ

(2) ඒ වගන්තියේ පාර්ශ්ව සටහන වෙනුවට පහත දැක්වෙන අලුත් පාර්ශ්ව සටහන ආදේශ කිරීමෙන් :—

"හදිසි අවස්ථා නියෝග සෑදීමට ජනාධිපතිවරයාට ඇති බලය.".